www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ඩෙංගු වසංගතය නිදහස් සෞඛ්‍ය සේවාවේ පිරිහීම පෙන්නුම් කරයි

## Dengue outbreak in Sri Lanka highlights deteriorating public health services

**අජිත ගුනරත්න විසිනි**
**2004 ජූනි 16**

මෑතකාලීනව ඩෙංගු උන සීඝ්‍ර ලෙස දිවයින පුරා පැතිරීම මගින් ලංකාවේ මහජන සෞඛ්‍ය සේවාවේ හා රෝගය වැලැක්වීමේ පියවරයන්හි අඛන්ඩ පරිහානිය විද්‍යාමාන වේ.

මෙම වසරේ ජනවාරි මාසයේ සිට ජූනි 8 දක්වා කාලසීමාවේ දී නිලවසයෙන් ඩෙංගු රෝගීන් 4347ක් හා ඩෙංගු රෝගීන්ගේ මරන 22ක් වාර්තා වී ඇත. මැයි මාසයේ පමනක් අප්‍රේල් මාසයේ වාර්තාගත වූ රෝගීන් ප්‍රමානය මෙන් තුන්ගුනයක් වාර්තා වී ඇති අතර නිල සෞඛ්‍ය සංඛ්‍යා ලේඛනවලට අනුව ගිය අවුරුද්දේ අදාල කාලසීමාවට වඩා මේ අවුරුද්දේ ප්‍රථම කාර්තුවේ සියයට හතලිහක වාර්තාගත වැඩිවීමක් දක්නට ඇත. කොලඹ අගනගරයේ මෙන් ම ගම්පහ, නුවර, කුරුනෑගල යන දිස්ත්‍රික්කවල ඩෙංගු ඉතා දරුනු ලෙස ව්‍යාප්තව ඇත.

දිවයින පුරා රජයේ රෝහල් ඩෙංගු හා වෛරස් උන රෝගීන්ගෙන් පිරිඉතිරී ගොස් ඇත. එමෙන් ම සෞඛ්‍ය පහසුකම්වල හිඟකම හේතුවෙන් පැතිරෙන පාචන වසංගතයකින් ද ජනවාරි මාසයේ සිට රෝගීන් 2800ක් විශේෂයෙන් නුවරඑලිය, මාතලේ, බදුල්ල, කලුතර, කොලඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් වාර්තාගත වී ඇත.

මදුරුවන් මාර්ගයෙන් පැතිරී යන ඩෙංගු උන උග්‍ර ගිලන් බවක් ඇති කරන අතර විශේෂිතව ලමුන්ට හා වැඩිහිටි අයට මරු කැඳවයි. වර්ෂ 1965 දී ලංකාවෙන් ප්‍රථම රෝගියා වාර්තා වූ අතර 1989 සිට ක්‍රමිකව ඇතිවන වසංගතයක් දක්වා පත්වෙමින් ඇත. රෝග ව්‍යාප්තියේ උච්ඡ අවස්ථාව එලඹෙනුයේ ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බොෆිත්ටස් යන රෝග වාහක මදුරුවන්ගේ ගහන ඝනත්වය විශේෂයෙන් ඉහල යන මෝසම් වැසිලිවලින් අනතුරුව ය.

රජය සහ සෞඛ්‍ය අමාත්‍යංශය ඩෙංගු වසංගතය නො වැලැක්විය හැකි ස්වභාවික උපද්‍රවයක් ය යන්න ඒත්තු ගැන්වීමේ උත්සාහයක නියැලෙමින් සිටින නමුදු මෙම රෝගය ව්‍යාප්ත වීමේ සැබෑ හේතූන් වනුයේ, දුර්වල සනීපාරක්ෂක පහසුකම්, ඵලදායක නො වන රජයේ රෝග නිවාරක ක්‍රම හා සෞඛ්‍ය සේවාවන්හි අරමුදල් කප්පාදු කර දැමීම යි.

'ඩෙංගු පාලනය' නමින් වාර්ෂිකව කරලියේ උත්කර්ෂයට එන ඊනියා වැඩසටහන රෝග ව්‍යාප්තියට මූලික වන කාරනා මුලිනුපුටා දැමීම වෙනුවට උත්සන්න වන ජනතා අවධානය සමහන් කිරීම ඉලක්ක කර ගෙන ක්‍රියාත්මක වේ. ඩෙංගු ව්‍යාප්තිය "මැඩලීම" සඳහා විශේෂ කාර්යය සාධන බලකායක් හා කමිටු ඇති කල ද 1989 සිට වසරක් පාසා ඩෙංගු රෝගීන් සංඛ්‍යාව වැඩි වී ඇත.

පෙර පැවති රජයන් මෙන් ම බලයේ පවත්නා එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය ද මදුරුවන් බෝවන තැන් වනසා නො දමන්නේ යයි සාමාන්‍ය මහජනතාවට අවලාද නැගීමේ උත්සාහයක නිරත ව සිටී. මෑතක දී සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා මහජනතාවට අනතුරු අඟවමින් ප්‍රකාශ කලේ තම වාසස්ථානවල මදුරුවන් බෝවන තැන් වනසා නො දමන අයට දඬුවම් පැමිනවීම සඳහා රජය විසින් නීති රෙගුලාසි සම්පාදනය කරමින් සිටින බව යි. කොලඹ නගර සභාව පුරවැසියන් හා ආයතන 1800කට අනතුරු ඇඟවීමේ ලිපි යවා ඇති අතර නිවැසියන්, සංවිධාන හා ආයතන 200කට විරුද්ධව නඩු දමා ඇත.

නමුත් ප්‍රාදේශීය සභා සහ මහ නගර සභා මහා පරිමාන ඩෙංගු අභිජනන ස්ථාන ඇතිවීම කෙරේ ඍජුවම වගකිව යුතුව ඇත. මනුෂ්‍ය වාසස්ථාන අවට විවෘත මහා පරිමානව කුනුකසල ගොඩවල් සෑදීමත්, මලද්‍රව්‍ය අපවහන පද්ධති, පල්වතුර කානු, වෙනත් අපිරිසිදු ජලය ඒකරාශී වන වලවල්, ගල්වලවල් පවිත්‍ර නො කිරීමට විරුද්ධව නිරන්තරව ජනතා උද්ඝෝෂන රජයට එල්ල වෙමින් පවතී. ප්‍රදේශවාසීන්ගෙන් එල්ල වූ විරෝධතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස පාරිසරික අමාත්‍ය ඒච්එම් ෆවුසි හට කොලඹ ආශ්‍රිත දෙහිවල ප්‍රදේශයේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයක් නැරඹීමට යාමට මෑතක දී සිදු විය.

අවිධිමත් නාගරික සංවර්ධනය බොහෝ මදුරු ව්‍යාප්ති ස්ථාන ඇතිවීමට තුඩු දී ඇත. ඉතා ඉහලට පැමින ඇති මදුරු ගහනය ඩෙංගු පමනක් නො ව මැලේරියාව, බරවා රෝගය, ජපන් කර්පරිදාහය වැනි රෝගවල ව්‍යාප්තියට ද හේතු වී ඇත. මදුරු දශ්ඨ කිරීමෙන් මිදීමට ලාංකිකයන් මසකට මදුරු දඟර විශාල ප්‍රමානයේ කන්ටේනර් 3ක් පුලුස්සා දමන බව වෛද්‍ය

අමල් හර්ෂ ද සිල්වා මහතා පවසයි. සමාජිකත්වයක් ඇති කෘමීන් හා රෝගවලට උන්ගේ ඇති සබඳතාවය පිලිබඳ අධ්‍යයනයන් සිදු කරන රජයේ කීටවිද්‍යා සහායකයින්ගේ සංගමය (ජීඊජ්යු) රජයට චෝදනා කරනුයේ ඔවුන් පර්යේෂනවලින් ලත් නිගමනයන් හා ඔවුන්ගේ තාක්ෂනික සහාය රජය නො සලකා හැර ක්‍රියා කරන බව යි. මේ අවුරුද්දේ මුල දී කරන ලද පර්යේෂනවලින් ඔවුන් පෙන්වා දෙන කරුනක් නම් අවුරුද්දේ වර්ෂා රහිත කාලයේ පවා පරිසර නියැදියක ඩෙංගු රෝගකාරක වෛරසය ව්‍යාප්ත කරන මදුරු ඝනත්වය Bretean Index ලෝක සෞඛ්‍ය සංවිධානයේ එම අගයට වඩා බොහෝ සෙයින් ඉහල නැග ඇති බව යි.

Breteau Index යනු සලකා බලන නිවාස ඒකක සියයක නියැදියක හමුවන මදුරු කීටයන් සහිත නිවාස ඒකක ගනනයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවා සිටින්නේ මෙම අගය 5කට වඩා වැඩි වන විට ඩෙංගු ඇති වීමේ අනතුරක් පවතින බව යි. කොලඹ ආසන්න මහර, මහරගම හා කෝට්ටේ ප්‍රදේශවල Breteau අගය පිලිවෙලින් 18, 12 සහ 30ක් වූ බව සොයා ගැනින.

කොලඹ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි ප්‍රදීප් කාරියවසම් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පවසා සිටියේ නිසිකලට වේලාවට ඩෙංගු පාලන වැඩසටහන් ආරම්භ කිරීමට බැරිවීම මුහුන දුන් එක් බරපතල ගැටලුවක් වූ බව යි. ''ඩෙංගු මදුරුවා පියාසර කරන්නේ මීටර් 100-200 දක්වා වන කෙටි ප්‍රදේශයකි. අපි ඩෙංගු පාලන කිරීමේ හා අධ්‍යාපන වැඩසටහන් කලින් ඇරඹුවා නම් ඇති වන තත්වය හා ගොදුරු වන රෝගීන් ප්‍රමානය අඩුකර ගැනීමට තිබුනි.''

වෛද්‍ය කාරියවසම් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ අවුරුදු 10-15ක සිට සේවකයින් බඳවා නො ගත් නිසා බරපතල ශ්‍රමබලකායේ හිඟයකට නගර සභාව මුහුන දී ඇති බව යි. ''අපට එකදු කීටවිද්‍යා සහායකයකු නැහැ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 50ක් අපට අවශ්‍ය වුවත් සිටින්නේ 23 දෙනෙකු පමන යි. ක්ෂේත්‍ර සහායකයන් 75ක් ඇවැසි නමුදු අපට සිටින්නේ 22 දෙනෙකු පමනයි. සෞඛ්‍ය උපදේශකයින් 150ක් අපට අවශ්‍ය නමුදු සිටින්නේ 70 දෙනෙකු පමනි.''

''අපේ අධ්‍යාපනික පනිවිඩයන් රූපවාහිනිය හා පුවත් පත් ඔස්සේ විකාශනයට අපට මුදල් අවශ්‍ය තරම් ලැබෙන්නේ නැහැ. තත්පර 15ක රූපවාහිනි දැන්වීමක් සඳහා එම ආයතන රු. 20,000ක් අයකරනවා. පුවත් පත් පිටුවක දැන්වීමක් සඳහා රු. 100,000ක මුදලක් අයකරනවා. අපට රාජ්‍ය මාධ්‍යවල පවා අවස්ථා හිමිවන්නේ නැහැ.''

නගර සභාවන්හි සේවාවන් පෞද්ගලිකරනයට ලක්කර තිබෙන තත්වයක් යටතේ තත්වය තවදුරටත් නරක අතට පත්කර ඇත. *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* ශ්‍රී ජයවර්ධනපුර නගර සභා ප්‍රදේශ වැසියකු මෙසේ ප්‍රකාශ කර සිටියේ ය. ''පිරිසිදු කරන්නන්ගේ සේවාවන් පෞද්ගලිකරනය කිරීම නිසා සේවකයින් සංඛ්‍යාව තවදුරටත් කප්පාදුවට ලක්ව ඇත. සේවකයකු පැමිනෙන තුරු දින ගනනාවක් කුනුකසල දුගඳ හමමින් තබා ගැනීමට අපට සිදුවෙනවා. මදුරුවන්ට කෘමිනාශක ඉසීම නවත්තලා, එහෙම නැත්නම් අඩුකරලා. මම මාස කිහිපයකින් මදුරු නාශක ඉසින සේවකයකු දැක්කේ නැහැ.''

සෞඛ්‍ය සේවාවන් කප්පාදුවට හා පෞද්ගලිකරනයට තවදුරටත් යෝජනා වී ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පෞද්ගලික ව්‍යවසායකයින්ට රෝග වැලැක්වීම පිලිබඳ කිසිදු උවමනාවක් නැති නිසා රෝග වැලැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා වන වියදම් බොහෝසෙයින් පහල වැටී ඇත. ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් සඳහා රජයේ ප්‍රතිපාදාන ලෙස 1989 දී සැපයූ සියයට 2.3ක ප්‍රතිශතය 2003 වන විට සියයට 1.4 දක්වා කපා හැර ඇත. ඉහත මුදලිනුත් සියයට 15.3ක් පමනක් ප්‍රජා සෞඛ්‍ය හා රෝග වැලැක්වීම වෙනුවෙන් වැය කරනු ලැබෙ යි.

රජයේ කීට විද්‍යා සහකාර සංගමයේ ලේකම් ආර්.පී. කුරුප්පුආරච්චි මෙසේ විස්තර කලේ ය. ''විමධ්‍යගතකරනය හා ඍජු අරමුදල් කප්පාදුව හේතුකොට ගෙන විශේෂිත රෝග පාලන වැඩසටහන් බොහෝ සෙයින් අඩාල වෙලා. මේවා උපදේශක සේවාවන් පමනක් බවට සීමා වෙලා. ඔවුන්ගේ අයවැයට ගැලපෙන්නේ නොමැති නම් පලාත් සභාවලටත් ප්‍රාදේශීය සභාවලටත් මෙම උපදෙස් නො සලකා හරින්න පුලුවන්. උදාහරනයක් ලෙස අපේ ජලභීතිකා ප්‍රතිශක්තිකරන ව්‍යාප්තියට සිදු ව ඇති දෙය බලන්න. සුනඛයන් ජලභීතිකාවට එරෙහිව එන්නත්කරනය නතරවෙලා තියෙනවා. දඩාවතේ යන සුනඛයන් ඇල්ලීම සිදුවන්නේ නෑ. අනෙකුත් වැඩසටහන්වලට වගේ ම ඩෙංගු පාලන වැඩසටහන්වලට ද සිදුව ඇත්තේ ද එම ඉරනම මයි.''

වසංගත රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍ය ප්‍රභා පලිහවඩන ද රෝග නිවාරන වැඩසටහන් ප්‍රමානවත් නොමැති බැව් පෙන්වා දුන්නා ය. ''රෝග නිවාරන වැඩසටහන් සඳහා වෙන්ව ඇති මුදල් ප්‍රමානවත් නැහැ කියල මම හිතනවා. ප්‍රමානවත් මුදල්, ශ්‍රම බලකායක් හා ජාතික මට්ටමේ වැඩපිලිවෙලක් නැතිව මෙවැනි වසංගත තත්වයන් මැඩලීම ඉතාම අපහසු යි.''

ඩෙංගු වසංගතයක් ලෙස පැතිර යාමේ තත්වය නිසා රජයේ රෝහල්වල තත්වය ඉතාම නරක අතට පත්වෙමින් ඇත. රෝහල් වාට්ටු උතුරා යන තරමට රෝගීන්ගෙන් පිරෙමින් පවතී. රෝගීන් 60කට පමනක් ප්‍රමානවත් වන වෛද්‍ය වාට්ටුවල රෝගීන් සංඛ්‍යාව 140-150 දක්වා ඉහල ගොස් ඇති අතර සෞඛ්‍ය කාර්ය මන්ඩලය අතිශය කාර්ය බහුල තත්වයකට පත්කොට ඇත. රෝගීන් දෙදෙනෙකුට හෝ වැඩි පිරිසකට ඇඳක් හවුලේ පාවිච්චි කිරීමට සිදුව ඇත. ඇඳන් රහිත ව බිම සිටින රෝගීන්ගේ සංඛ්‍යාව ද වැඩිවෙමින් පවතී.

මදුරු උවදුරින් ආරක්ෂා වීම සඳහා සපයා දිය යුතු අවම අවශ්‍යතාවක් වන මදුරු දැල් පවා රෝගීන්ට හා කාර්ය මන්ඩලයට සපයා දී නැත. කොලඹ දකුන මහරෝහලේ උපස්ථායිකාවක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ දන්වා සිටියා ය. ''අපේ වාට්ටුවේ සැලකිය යුතු ඩෙංගු උන රෝගීන් සංඛ්‍යාවක් නේවාසිකව ප්‍රතිකාර ලබනවා. දැනටමත් වාට්ටුවේ රාජකාරියේ නියුතු හෙද නිලධාරිනින් දෙදෙනෙකුත් ඩෙංගු උන රෝගීන් බවට පත්වෙලා තියෙනවා. ඔවුන්ට ඩෙංගු වැලඳී ඇත්තේ වාට්ටුවේ දී කියලයි අපිට හිතෙන්නේ.''

රජයේ රෝහල්වල ඩෙංගු රෝග විනිශ්චයට උපකාරි වන රුධිර පරීක්ෂා කිරීම්වල පවතින අඩුපාඩු හේතුවෙන් රෝගීන් පුද්ගලික රසායනාගාර කරා යොමු කරන තත්වයක් උද්ගත වී ඇත.

ලංකාවේ පුද්ගලික රසායනාගාර සේවාවන්වල ප්‍රමුඛ ආයතනය වන ආසිරි පෞද්ගලික රෝහලේ රසායනාගාරය දිනකට අවම වසයෙන් පූර්න රුධිර සෛල පරීක්ෂන එෆ්බීසී දහසක් හා ඩෙංගු මස්තු පරීක්ෂන සියයක් සිදු කර යි. එකදු රජයේ රෝහලකටවත් ඩෙංගු රෝග විනිශ්චය කිරීමේ ඩෙංගු මස්තු පරීක්ෂන (Dengue Serology test) සඳහා පහසුකම් නැත. බොහෝ රෝගීන්ට ඩෙංගු රෝග නිශ්චිතව තහවුරු කර ගැනීම සඳහා වන මෙම පරීක්ෂනය සඳහා වන වියදම දැරීමට නො හැකි ය.

ශ්‍රී ලංකා ජාතික රෝහලේ හෙදියන් මෙලෙස ප්‍රකාශ කලහ. මෙහි සිටින බොහොමයක් රෝගීන් ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත සේවයේ නියුතු අනියම් කම්කරුවන්. අනෙක් රෝගීන් වෙනත් සුලු සුලු රැකියාවන්වල නියුතුවූවන්. ඔවුන්ට බාහිරින් රුධිර පරීක්ෂන කර ගැනීමේ වියදම දැරිය නො හැකි යි. එෆ්බීසී රුධිර පරීක්ෂනයක් සඳහා වන වියදම ඔවුන්ගේ දිනක වැටුපෙන් බාගයක් ඒ කියන්නේ රුපියල් 200ක් (ඇමරිකානු ඩොලර් 2) පමන වේ. අපට සීමිත එෆ්බීසී පරීක්ෂන ප්‍රමානයක් පමනයි රෝහලෙන් කරගන්න පුලුවන්. ඩෙංගු සීරම් පරීක්ෂාව සඳහා එක් රෝගියකු රුපියල් දාහක් බාහිර රසායනාගාර සඳහා වියදම් කල යුතු වෙනවා.''

අසාධ්‍ය ඩෙංගු රක්තපාත අවධියේ සිටින රෝගීන් සඳහා තත්වය ඊටත් නරක ය. ඔවුන් බොහොමයක් දැඩිසත්කාර ඒකකවල ප්‍රතිකාර ලැබිය යුතු වුව ද වැඩි ප්‍රතිශතයකට ඒ අවස්ථාව අහිමිව ඇත. ඉතා සීමිත මහරෝහල් කිහිපයක පමනක් දැඩිසත්කාර පහසුකම් පවතින අතර එසේ සීමිතව හෝ පවතින තැන්වල පවා රෝගියකුට ඇඳක් හිමි කර ගැනීම උගහට කරුනකි. අසාධ්‍ය තත්වයේ පසුවන රෝගීන් සඳහා අත්‍යවශ්‍ය රුධිර පාරවිලයනය හා පට්ටිකා පාරවිලයන සේවාවන් බොහොමයක් රෝහල්වල නො පවතින අතර පවතින ස්ථානවල ඒවා ප්‍රමානවත් නැත.

නිදහස් සෞඛ්‍ය සේවය හා නිවාරන වැඩසටහන් තවදුරටත් පරිහානියට ලක්වෙද්දී පවත්නා රජයට සෞඛ්‍ය සේවයේ ප්‍රගතියක් සඳහා ඉවහල් විය හැකි වැඩපිලිවෙලක් තබා අදහසක් වත් නැත. ගිය මාසයේ සෞඛ්‍ය ඇමති ද සිල්වා ඩෙංගු සීඝ්‍ර ලෙස පැතිරීම කෙරෙහි පවත්නා මහජන විරෝධය නො තකා හරිමින් කුහක ලෙස ප්‍රකාශ කර සිටියේ රෝග නිවාරන අංශය කෙසේ වෙතත් රෝගයට ප්‍රතිකාර කිරීමේ අංශය හොඳින් ක්‍රියාත්මක වන බව යි.

''ඩෙංගු පාලනය සඳහා අවශ්‍ය සියලුම ඖෂධ වර්ග හා ප්‍රමානවත් අරමුදල් අපේ සෞඛ්‍ය සේවාව සතුව පවතිනවා. එමනිසා ප්‍රතිකාර සම්බන්ධයෙන් නම් බියවීමට හේතුවක් රෝගීන්ට නැහැ'' ඔහු පැවසී ය.

© www.wsws.org